අගේ කළා. හයේ පන්තියේ ළමයෙක් විදිහට මට ඒක ලොකු දෙයක් වුණා. චිත්‍රා ප්‍රනාන්දු කියලා සිංහල ගුරු මහත්මියක් හිටියා. මට හරි ආදරෙයි. අනෙක් ගුරුවරුන්ගෙත් සහාය මට ලැබුණා. ඒ නිසා දිගින් දිගටම ලියන්න පටන්ගත්තා. ගාල්ල රිච්මන්ඩ් එකේ ඉන්නකොට මම ලියන කවි මහගම සේකරට යවනවා. ඒවා බලලා මට ලියලා එවනවා හොඳ නරක ගැන. ඒ නිසා කවි කලාවත් එක්ක ලොකු සම්බන්ධයක් ඇතිවුණා. නමුත් මාමලා නැන්දලාගේ පෙළඹවීම නිසා මම ඉගෙන ගත්තේ විද්‍යා අංශයෙන්. නමුත් වැඩි සම්බන්ධකම් ඇතිවුණේ කලාව පැත්තෙන්.

**ඒ තරම් පුංචි කාලෙදිම කවි ලිවීමට පෙළඹුණේ දක්ෂයෙක් වුණේ කොහොමද ?**

මම දන්න තරමින් නම් අපේ පරම්පරාවේ කලාවට සාහිත්‍යයට සම්බන්ධ කිසිම කෙනෙක් හිටියේ නෑ. හැබැයි ඉතිං පුංචි අම්මලා මාමාල කවි කියනවා. පොළේ ගියාම කවි කොළ ගේනවා. ඒ ඇරෙන්න පවුල් පසුබිමේ මට ලොකු පෙළඹවීමක් තිබුණේ නෑ. මටත් හිතාගන්න අමාරුයි ලවීමට සහ කියවීමට මේ විදිහට දක්ෂ වුණේ ඇයි කියලා. උසස් පෙළ පන්තිවල ඉන්න කාලේ මහගමසේකරත් එක්ක මගේ සම්බන්ධකම් ඇතිවෙනවා. සේකරගේ කවිවලට ගීත වලට මගේ ලොකු ආසාවක් තිබුණා. මුල් කාලෙදි මමත් ඒ වගේ ලියන්න උත්සාහ කළා. එහෙම ලියලා එයාටම යැව්වම එයාගේ ප්‍රතිචාරය දක්වලා එවනවා. මේක තමයි පාසල් කාලෙදි මාව තවදුරටත් ලියන්න පෙළෙඹවපු උත්ප්‍රේරකය. 76 තරුණ සේවා සභාව පිහිටුවලා ඒකෙන් පටන් ගන්නවා යෞවන සම්මාන තරගාවලියක්. ඒකේ තියනවා සමස්ථ ලංකා කාව්‍ය හා ගීත රචනා කියලා තරගයක්. මේකෙ මුලින්ම පළවෙනියට තේරුණේ මම ලියපු කවි පෙළක්. ඒක ලොකු ඇගයීමකට ලක්වෙනවා. මම ලියපු ගීතයකටත් තෑග්ගක් හම්බ වෙනවා. එතන ඉදලා අවුරුදු 29 උපරිම වයස් සීමාවට එනකම් දිගටම මම කවි හා ගීත රචනාවලට යෞවන සම්මාන ගන්නවා.

**කවි ලියන්නේ කොහොමද ?**

ජීවිතේ අත්විදීම් සහ අත්දැකීම් කියලා දෙකක් අපි ලබනවානේ. මට සිද්ධවෙන දේවල් අත්විදින දේවල්. වෙනත් අයගේ අත්විදීම් ගැන අහන්න දකින්න කියවන්න ලැබෙන දේවල් සහ පරිකල්පනයෙන් ලබන දේවල් අත්දැකීම්. කවර අත්දැකීමක් හෝ අත්විදීමක් වේවා එයින් සිත සසළ වුණාම කම්පනයට පත්වුණාම ඒ කාරණය තවත් කෙනෙකුට කියන්න ඕනේ කියලා හිතෙනවා. එතනදි තමයි කවියක් ලියන්න ඕනේ කියලා කල්පනා වෙන්නේ. ඊට පස්සේ මම කල්පනා කරනවා මේක කියන්නේ වචන වලින්නේ. මේකට ගැළපෙන හොඳම වචන මොනවද කියලා කල්පනා කරනවා. ඊළගට මේක කියන්න සුදුසු කාව්‍ය ආකෘතිය මොකක්ද කියලා කල්පනා කරනවා. සඳැස් ආකෘතියක්ද නිදහස් ආකෘතියක්ද රිද්මය මොකක්ද වගේ කාරණාත් සැළකිල්ලට ගන්නවා. කියන්න යන දේත් එක්ක මේ සියල්ලම ගැළපෙන්න ඕනේනේ. ඒ ටික තෝරාගෙන ලියනවා. මුලින්ම කවිය ලියන්නේ තමන් වෙනුවෙන්. තමන් ඒකෙන් සෑහීමකට පත්වුණොත් තමයි ඒක වෙනත් අයෙකුට දෙන්නේ. මුලින්ම කවි ලියන කාලේ එකම කවිය හත් අට වාරයක් කපමින් කොටමින් සංස්කරණය කරපු අවස්ථාත් තිබුණා. නමුත් දැන් නම් එහෙමම කපන්න කොටන්න වෙනවා අඩුයි. බොහොම ක්ෂණිකව ලියැ-වෙන ඒවත් තියනවා. සමහර විට ලියවිලා කාලයක් තිබිලා සංස්කරණය වෙලා එන අවස්ථාවනුත් තියනවා.

**කවිය ගැන කිසියම් හැදෑරීමක් කරලා තියනවාද ?**

කවි ගැන එහෙම හැදෑරීමක් කියලා දෙයක් විශේෂයෙන් කරලා නෑ. නමුත් මම සිංහල ගෞරව උපාධියක් කරන නිසා මට ඒක හුගක් අධ්‍යනය කරන්න සිදුවුණා. සෙල් ලිපි වල ඉදලා සීගිරි ගී වල ඉදලා මේ වෙනකම් තිබුණ හැම කවි ශිල්පයක්ම අධ්‍යනය කරන්න අවශ්‍යවුණා. ඒ හැර අමුතුවෙන් ඉගෙන ගැනීමක් සිදුවුණේ නෑ.

**කවියෙන් ගීතයට යොමුවෙන්නේ ?**

ඒ කාලේ මම ගුවන් විදුලි වැඩසටහන් වලට හුගක් ලියනවා. ඒකත් සේකර තමයි සම්බන්ධ කරලා තිබුණේ. අද ලියැවෙන කවි කියලා වැඩසටහනක් තිබුණා. ලූෂන් බුලත්සිංහල නිෂ්පාදනය කළ යෞවන සමාජය වැඩසටහනට මම ලියපු ගීතයක් ගුණදාස කපුගේ ගායනා කරනවා හැත්තෑපහේදී. ඒක තමයි මගේ මුල්ම ගීතය. හැත්තෑහයේ කපුගේ නිෂ්පාදනය කරන නව පදමාලා වැඩසටහනට මගේ ගීත කීපයක් පටිගත වෙනවා. ඒ වෙනකොට කපුගේ දැකලා හදුනාගෙන තිබුණේ නෑ. මුල්වරට කපුගේ මට හමුවෙන්නේ 82 අවුරුද්දේ "කාලයේ රාවය"ට ගීත රචනා තෝරන්න වැඩමුළුවක් තිබුණා ඒකට මම ගිය වෙලාවෙයි ඒක සිදුවුණේ. හුගදෙනෙක් කියනවා මම මුලින් කවි ලියලා පස්සේ ගීතයට ගියා කියලා. එහෙම දෙයක් වුණේ නෑ. ඒ කලේ ඉදලම මගේ කවි සහ ගීත කියන දෙකටම සම්බන්ධය තියනවා. මුල්ම අවධියේ මට කවියයි ගීතයයි අතරේ ලොකු වෙනසක් තේරුණේ නෑ. නමුත් මුල ඉදලම මේ දෙකම මම පරිහරණය කරනවා.

**'කුමන හෝ නිර්මාණයක් මගින් කුමන හෝ දේශපාලන අරමුණක් ඉටුවෙනවා' කියා ඔබ විශ්වාස කරනවා. කවියෙක් ගීත රචකයෙක් විදිහට මොකක්ද ඔබේ නිර්මාණකරනයේ දේශපාලන අරමුණ ? එදා මෙදා අතර එය කොයිතරම් දුරට ඉටුවෙලා තියනවද ?**

කවියෙකුට කලාකාරයෙකුට මේ සමාජය දේශපාලනඥයෙකුට වගේ වෙනස්කරන්න පුළුවන් කමක් නෑ. හැබැයි සමාජීය වෙනසක් සඳහා අවශ්‍ය ප්‍රඥාව දැනුම ලබාදීම කළ හැකියි. හැම කලාකරු-වෙකුටම තමාට අදාළ සමාජ පරිසරයක් තියනවානේ. ඒ කියන්නේ ඔහු ජීවත්වන සමාජ ආර්ථික පරිසරය. ඔහු ඉන් දේශපාලන ක්‍රමය මොකක්ද?සංස්කෘතික හා අර්ථ ක්‍රමය මොකක්ද ? අපි ලියන හැම අකුරක්ම කාට හරි සේවය කරනවා. එයින් යම් මතවාදයක් නියෝජනය වෙනවා. නමුත් අපි ලියන්නේ ඒ මතවාදය වෙනුවෙන් නෙවෙයි. කලාකරුවෙකුගේ නිර්මාණ තුළින් ප්‍රකාශයට පත්වෙන්නේ තමන් ජීවත්වන පරිසරයේ දේශපාලන සමාජ යථාර්ථයන්. ව්‍යාජ වෙන්නේ වත් වංක වෙන්නේවත් නැතුව ඒක නිවැරදිව ග්‍රහණය කරගන්න එකයි අවශ්‍ය වෙන්නේ. මිනිස්සුන්ගේ භාව ලෝකය පුළුල් වන ආකාරයේ රස වින්දනයක් ලබාදුන්නම මිනිස්සු නැවත නැවතත් ඒක ඉල්ලනවා. ඒ භාව ලෝකය පුළුල් කිරීමත් මේ දේශපාලන අරමුණ කියන එකට අදාළයි. මම හිතන්නේ සාහිත්‍ය නිසා ආකල්පමය වශයෙන් වෙනස් වෙච්ච මිනිස්සු ඉන්නවා. නිර්මාණ විදිද්දි කඳුළු සළන පුද්ගලයන් ඉන්නවා අපි දැකලා තියනවානේ.

**ඔබට දේශපාලන දැක්මක් ලැබෙන්නේ කොහොමද ?**

උසස් පෙළ පන්තිවල ඉන්න කාලේ ඉදලම ඇසුරු කරන්නට ලැබුණ අය නිසා ඒ කාලේ ඉදලම යම් යම් දේශපාලන මතිමතාන්තර එක්ක මම වැඩකරනවා. මම ජීව විද්‍යා පන්තියේ ඉගෙන ගන්නකොට නීතීඥ විජේදාස ලියනාරච්චි ඉගෙන ගත්තේ සමාන්තර පන්තියක් වුණ ගණිත අංශයේ. ඔහු තමයි අපිව මුලින්ම දේශපාලනයට යොමුකරන්නේ. ඒ දේශපානයෙන් යම් යම් දේවල් ඉගෙනගෙන හදාරල ඊට පස්සේ මම ගමේ සමසමාජ සමිතියේ සභාපති වෙලා හිටියා. ජන වේගය ව්‍යාපාරයට සම්බන්ධ වෙලා වැඩකළා. මටත් දේශපාලනයක් තිබුණා. ඒක දිගටම වාමාංශික දේශපාලනයක් තමයි. නමුත් මම ඒතරම්ම පක්ෂ දේශපාලනයට යොමුවුණේ නෑ. නමුත් මම දන්නවා මම කරන හැම වැඩකම දේශපාලන පදනම-ක් තියනවා කියලා.

**ඔබ ලියූ ගුණදාස කපුගේ ගායනා කළ 'සිංහල සිංදු කියන නලලේ තිලක තියන කිරිල්ලී' ගීතය අනුවේදනීය පුවතක් පසුබිම් කරගත්ත ගීයක්. දැන් ඒ ගීතය ඇහෙනකොට මොන වගේ හැගීමක්ද හිතට ඇතිවෙන්නේ ?**

අනූහතරේ හෝ අනූපහේ අවුරුද්දේ දයාසේන ගුණසිංහ මහත්තයාගේ සංස්කාරකත්වයෙන් සිව්දෙස කියලා සගරාවක් පළවුණා. ඔය සගරාවේ පළවුණ එක්තරා ලිපියක් කියවලා කපුගේ මට දුරකථන ඇමතුමක් දීලා කියනවා මෙහෙම ලිපියක් තියනවා ඒක කියවන්න කියලා. ඒ ලිපියේ තිබුණේ දකුණු පළතේ කඹුරුපිටිය පළාතේ සිංහල යුවතියක් පොලිස් කාන්තාවක් විදිහට පත්වීමක් ලබලා අගනුවර පොලීසියක වැඩට යනවා. කිරුළපොන සහ මිරිහාන පොලීසිවල වැඩකරනවා. ඇයට යාපනයෙන් ආව දෙමළ ජාතික පොලිස් නිලධාරියෙක් මුණගැහෙනවා. මේ දෙන්නා අතරේ ප්‍රේම සම්බන්ධයක් ඇතිවෙනවා. ඒ සම්බන්ධයට දෙපැත්තෙම නෑදෑයින් විරුද්ධ වෙනවා. ඒ විරෝධය නොතකා මේ දෙන්නා විවාහ වෙනවා. විවාහ වෙනවත් එක්කම වගේ අසූ තුනේ ජූලි කලබල එනවා. එතනදි විවිධ ප්‍රශ්න මතුවෙලා මේ පොලිස් නිලධාරියා සේවයෙන් ඉවත්වෙලා සිංහල බිරියත් එක්ක යාපනයට යනවා. එතකොට එහෙ යුද්දේ පටන් අරන්. මේ කතා ප්‍රවෘත්තිය කියවුවාට පස්සේ ලොකු හැගීමක් ඇතිවුණා. ප්‍රේමය කියන එක ජාති කුල ගෝත්‍ර වර්ණ පන්ති භේද ඉක්මවා පවතින දෙයක්නේ. ඒක තමයි සිංහල සින්දු කියන ගීතය ලියවෙන්න මුල් වෙන්නේ. කපුගේ මේක ගායනා කරළා සෑහෙන පස්සේ කාලෙක තමයි මම දැනගත්තේ මේ යුවතිය විනීතා සමරසිංහ ගුණසේකර. පිරිමියා එල්ටීටීඊ සංවිධානයේ පොලිස්පති පී නඩේසන් කියලා. 2002 සටන්විරාම වෙලාවේ උතුරටය ගිය පුවත්පත් කලාවේදියෙක් නඩේසන් හම්බවෙලා අහනවා දන්නවද ඔය දෙන්නා ගැන සිංහලෙන් සිංදුවක් ලියැවිලා තියනවා කියලා. ඒ වෙලාවේ නඩේසන් අහලා තියනවා අපිට බැනලද කියලා. නෑ නෑ මම ඒක සුමානෙකින් එවන්නම් කියලා ඇවිල්ලා සුමානයකින් අපහු නඩේසන්ට කතාකරනකොට නඩේසන් ඒ සින්දුව ගෙන්නගෙන අහලා තියනවා. පස්සේ මට දැනගන්න ලැබුණා නඩේසන්ගේ ලොකු දුවට මේක හොදට තාලෙට ගායනාකරන්න පුලුවන්කමත් තිබුණාලු කියලා. යුද්ධය ඇවිලෙන වෙලාවේ ජාතිවාදී හැගීම් තියන හුගදෙනෙක් මේ ගීතය ලියපු එකට මට දුරකථනයෙන් කතාකරලා පවා බැන්නා. මේ අය යුද්ධයෙන් මියගියාට පස්සේ දැන් මට මේ ගීතය ඇහෙනකොට විශාල කම්පාවක් ඇතිවෙනවා.


